**යාපනය මහනගර සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**-----------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2016 මාර්තු 29 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 27 දින ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2016 ඔක්තෝබර් 20 දින සභාවේ කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**---------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශන වලින් යාපනය මහනගර සභාවේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිමු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ දෝෂ
**------------------**

පහත සඳහන් ගණකාධිකරණ දෝෂ නිරීක්ෂණය වේ.

(අ) සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ගෙවිය යුතු රු.115,492,500 ක් වූ විශ්‍රාම වැටුප් දායක මුදල ගෙවිය යුතු මුදලක් ලෙස ඉකුත් වර්ෂයේ මුදල් ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමුච්චිත අරමුදල වැඩියෙන් දක්වා තිබුණි.

#### 1.3.2 ගෙවිය යුතු මුදල්
**------------------**

විස්තර පහත දැක්වේ.

(අ) රු.7,112,085 ක් වූ අත්තිකාරම් පියවීම සඳහා වසර 5 කට අධික කාලයක් තුළ කටයුතු කර නොතිබුණි.

(ආ) රු.79,180 ක් වූ ලැබිය යුතු වැටුප් ණය 2011 වර්ෂයේ සිට පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රු.663,200 ක් වූ විශ්‍රාමිකයන් 138 දෙනෙකුගෙන් ලැබිය යුතු ණය පියවීම සඳහා වසර 5 කට අධික කාලයක් තුළ කටයුතු කර නොතිබුණි.

### 1.3.3 සාක්ෂි නොමැතිකම

විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකරීම නිසා රු.663,255 ක වටිනා ගනුදෙනු හතක් විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි විය.

### 1.3.4 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(අ)** 1987 මහනගර සභා ආඥා පනත 252 පරිච්ඡේදයේ 42 (අ )වගන්තිය | (i) අනවසර තාවකාලික සාප්පු හා ඉදිකිරීම් 17 ක් පිළිබඳව කටයුතු කර නොතිබුණි.<br>(ii) සභා සීමාව තුළ ඉදිකරන ලද අනවසර විදුලි සංදේශන කුළුණු 19 ක් පිළිබඳව කටයුතු කර නොතිබුණි. |
| **(ආ)** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) අංක 381 (3) | මුදල් කටයුතු පිළිබඳ වගකිව යුතු නිලධාරීන්ගෙන් ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි. |
| (ii) අංක 571 | රු.4,353,847 ක් වූ මිශ්‍ර තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. සභාවේ නගර සභාපති සහ සභිකයන් විසින් ලබාගත් රු.901,681 ක් වූ ජාත්‍යාන්තර ඇමතුම් ගාස්තු වියදම් මහ නගර සභා අරමුදලින් දරා තිබුණි. |
| (iii) අංක 849(2) | සභාවේ නගර සභාපති සහ සභිකයන් විසින් ලබාගත් රු.901,681 ක් වූ ජාත්‍යාන්තර ඇමතුම් ගාස්තු වියදම් මහනගර සභා අරමුදලින් දරා තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ඉකුත් වර්ෂය සඳහා වූ රු.157,166,226 ක් වූ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම සමඟ සැසඳුවිට, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.144,760,154 ක් විය. වියදම් වැඩිවීම හේතුකොට ගෙන පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,406,072 කින් අඩු විය.

## 2.2 කාරක ප්‍රාග්ධනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ඉකුත් වර්ෂය සඳහා වූ රු.448,510,646 ක් වූ කාරක ප්‍රාග්ධනය සමඟ සැසඳුවිට සමාලෝචිත වර්ෂය සඳහා වූ සභාවේ කාරක ප්‍රාග්ධනය රු.581,228,518 ක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් කාරක ප්‍රාග්ධන රු.132,717,872 කින් වැඩි වී තිබුණි.

## 2.3 ආදායම් කළමනාකරණය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

කොමසාරිස් විසින් ඉදිරිපත් කරන ලද පරිදි, සමාලෝචිත වර්ෂය සඳහා වූ ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015 | | 2015දෙසැම්බර්31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තත්‍ය | රු'000 |
| | රු'000 | රු'000 | |
| වරිපනම් හා බදු | 58,819 | 64,899 | 69,807 |
| බදු කුලී | 62,504 | 90,306 | - |
| බලපත්‍ර ගාස්තු | 19,514 | 17,476 | - |
| වෙනත් ආදායම් | 629,298 | 575,054 | 311,349 |
| එකතුව | 770,135 | 747,735 | 381,156 |

### 2.3.2 වරිපනම් සහ බදු

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) ආදායම් පරීක්ෂක විසින් ගෙවීම් පැහැර හැරීම් උපලේඛණය පිළියෙල කර නොතිබුණි.

(ආ) රු.69,897,431 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කොමසාරිස් විසින් කටයුතු කර නොතිබුණි.

### 2.3.3 බදු සහ කුලී

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) සභාවට අයත් සාප්පු 184 ක අයිතිය පුද්ගලික පාර්ශවයන්ට පැවරීම සම්බන්ධයෙන් නෛතික කටයුතු කර නොතිබුණි.

(ආ) රු.4,897,657 ක් වූ කුලී මුදල් සමාලෝචිත වර්ෂය තුලදී අයකරගෙන නොතිබුණි.

**2.3.4 බලපත්‍ර ගාස්තු**

රු.283,734 ක් වූ බලපත්‍ර ගාස්තු අයකර නොතිබුණි.

**2.3.5 මුද්දර ගාස්තු**

ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් ලැබිය යුතු රු.262,435,940 ක් වූ මුද්දර ගාස්තු ලැබී නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

**(අ) අවිධිමත් පත්කිරීම්**

(i) 2013 වර්ෂයේදී පත්කරන ලද විදුලි කාර්මිකයන් 07 දෙනෙක් අතරින් 06 දෙනෙකු අවශ්‍ය සුදුසුකම් නොමැතිව පත්කර තිබුණි.

(ii) අදාල අනුමැතියෙන් තොරව, කොන්ත්‍රාත් පදනමකින් පත්කළ පශු ශල්‍ය වෛද්‍යවරයාට රු.419,215 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(iii) කොන්ත්‍රාත් පදනමින් පත්කළ ඉංජිනේරුවරයාට අනුමැතියක් නොමැති කාලපරිච්ඡේදය තුලදී වැටුප් සහ ඉන්ධන වියදම් වශයෙන් රු.750,791 ක් ගෙවා තිබුණි.

(ආ) සේවක භාරකාර අරමුදලට ප්‍රේෂණ නියමිත කාලය තුළ ගෙවීම් ප්‍රමාද කිරීම නිසා රු.387,173 ක අධිකාර වශයෙන් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් නොසැලකිල්ල මත ප්‍රමාදයට වගකිව යුතු නිලධාරීයාගෙන් අයකිරීම් සිදුකර නොතිබුණි.

(ඇ) 2009 ජනවාරි 28 දිනැති අංක පීටී/01/2009 දරන පලාත් භාණ්ඩාගාර චක්‍රලේඛයට පටහැනිව, සමීක්ෂණ මණ්ඩලයට රු.56,500 ක මුදලක් දිරිදීමනා ලෙස ගෙවා තිබුණි.

(ඈ) ප්‍රමාදයකින් තොරව ගොඩනැගිලි පරීක්ෂා කොට අනුමත කිරීම සඳහා රු.168,200 ක් වූ දිරිදීමනා ගෙවා තිබුණි.

(ඉ) ආයතන සංග්‍රහයට පටහැනිව 2012 වර්ෂයේදී සහා අරමුදලින් ගෙවන ලද රු.611,000 ක් වූ කුලී ගාස්තු මේ දක්වා නිරවුල් කර නොතිබුණි.

(ඊ) 2014 ජූලි 19 දින සිදුවූ වාහන අනතුරකට අදාල හිමිකම් රක්ෂණ සංස්ථාව වෙතින් ලබා නොගැනීම නිසා පාඩු විදීමට සිදුව තිබුණි. පසුව, ආසන්න වශයෙන් රු.1,958,200 ක් වූ පිරිවැයක් දරා වාහනය අලුත්වැඩියා කරගෙන තිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

අවිධිමත් අයවැය පිළියෙල කිරීම හේතුකොටගෙන, රු.331,430 සිට රු.40,799,053 දක්වා වූ වෙනස්කම් අයවැයගත වියදම් හා තත්‍ය වියදම් අතර නිරීක්ෂණය විය.

**4.2 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්**

**---------------------------------------------**

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.

**4.3 වත්කම් කළමනාකරණය**

**----------------------------**

**අවභාවිත වත්කම්**

**-----------------**

සභාවට අයත් වාහන 19 ක් භාවිතා කිරීමෙන් තොරව සභා පරිශ්‍රයේ ගාල්කර තිබුණි.

**5. පද්ධති හා පාලන**

**------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ආදායම් රැස්කිරීම
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) පරිත්‍යාග
(ඈ) වාහන උපයෝජනය
(ඉ) මිශ්‍ර තැන්පතු
(ඊ) අයවැය